මගේ අංකය: JSC/SEC/CIR – L/2023

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 08/2023**

සියලුම මහාධිකරණ විනිශ්වයකාරවරුන්,

සියලුම අධිකරණ නිලධාරීන්,

සියලුම කම්කරු විනිශ්වයාධිකාර සභාපතිවරුන් සහ

රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත,

**විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කිරීම.**

ශීර්ෂගත කරුණට අදාලව පුනරුත්ථාපන කාර්යාංශයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්.අයි.ජී. විදානගමගේ මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවට පිටපතක් සහිතව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති අංක: පුනකා /ප්‍ර / 01/01/2023 (132) හා 2023.04.09 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එය ඔබගේ අධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව, එම ලිපිය අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කොට ඔබගේ අවධානයට ලක් කරමි.

03. එසේම, "රැඳවියන් කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත යොමු කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු" යන ශීර්ෂය යටතේ 2022.09.20 දිනැතිව අධිකරණ සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 12/2022 සමඟ අමුණා තිබූ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයාගේ 2022.08.16 දිනැති ලිපිය ද අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වැඩිදුරටත් ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 අප්‍රේල් මස 24 වෙනි දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
**BUREAU OF REHABILITATION**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
No: 462/2 ,Kaduwela Road , Ganahena , Battaramulla.

මගේ අංකය / எனது இல / My No: පුනකා/ප්‍ර/01/01/2023 ( [illegible] )
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.04.07

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

ගරු ලේකම් තුමියණි,

**විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කිරීම.**

යොමුව:
අ. අංක JSC/SEC/CIR- L/2022 හා 12/2012 දරණ 2022.09.20 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය.

1. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර යහපත් පුද්ගලයන් වශයෙන් සමාජගත කිරීම මෙම කාර්යාංශය විසින් සිදු කරනු ලබන අතර ඒ සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කන්දකාඩු, තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය සේනපුර හා ඒකාබද්ධතා මධ්‍යස්ථානය වව්නියාව පවත්වා ගෙන යනු ලබයි.

2. මෙම පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙහි දළ වශයෙන් පුනරුත්ථාපනලාභීන් 1120 ක පමණ ප්‍රමාණයක් එකවර පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි අතර, දැනට පුනරුත්ථාපනය වනු ලබන පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව සහ තවදුරටත් මධ්‍යස්ථානයන් වෙත ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනලාභීන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි බැව් දන්වා සිටිමි.

| මධ්‍යස්ථානය | පුනරුත්ථාපනය කළ හැකි පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | දැනට සිටින පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය | තවදුරටත් ඇතුළත් කර ගත හැකි පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණය |
|---|---|---|---|
| ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය - කන්දකාඩු | 500 | 210 | 290 |
| තෘතීයික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර | 500 | 222 | 278 |
| ඒකාබද්ධතා මධ්‍යස්ථානය - වව්නියාව | 120 | 96 | 24 |
| එකතුව | 1120 | 528 | 592 |

3. තවද මෙම පුනරුත්ථාපන ක්‍රියාවලිය මාස 06 ක කාල සීමාවක් තුළ සිදු කරනු ලබන බැවින් එම කාල සීමාව අවසානයේ සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණයන් අනුව අඛණ්ඩව පුනරුත්ථාපන සඳහා යොමු කිරීමේ හැකියාවක් පවතී.

4. ඒ අනුව යොමුගත චක්‍රලේඛයෙහි දක්වා ඇති නිර්ණායකයන්ට අනුකූලව පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපනය කිරීමේ හැකියාවක් ඇති අතර ඔබ ආයතනයන් යටතේ ඇති සියළු ස්ථාන දැනුවත් කර විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවැසි ඉදිරි කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

එච් අයි ජී විදානගමගේ ආර්එස්පී අයිජී
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂ (පුනරුත්ථාපන/පසුප්‍රශා)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

පිටපත් :
1. අධිකරණ සේවා කොමිෂන් සභාව
2. සභාපති - විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වළක්වාලීම සඳහා කාර්ය සාධක බලකාය.
3. පොලිස්පති - පොලිස් මූලස්ථානය
4. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් - බන්ධනාගාර මූලස්ථානය

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය
புனர்வாழ்வு ஆணையாளர் நாயகம் பணியகம்
BUREAU OF THE COMMISSIONER GENERAL OF REHABILITATION
අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS


අංක : 462/2 , කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல : 462/2, கடுவெல வீதி, கனேஹேன, பத்தரமுல்ல.
No : 462/2 ,Kaduwela Road , Ganahena , Battaramulla.


මගේ අංකය / எனது இல: / My No. } පුනකොජ/නීති/නීතිපති උපදෙස්/01/2022 (

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022.08.16

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

ගරු ලේකම්තුමියණි,

**රැඳවියන් කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත ඇතුලත් කිරීමේදී සලකා බැලිය යුතු අවම නිර්ණායකයන් පිළිබඳව දැනුවත් කිරීම**

**යොමුව**

අ. අංක NP/SP/P&RP/CM/13/4 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය. (පිටපතක් අමුණා ඇත)

1. ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර යහපත් පුද්ගලයින් වශයෙන් සමාජගත කිරීම මෙම කාර්යාංශය විසින් සිදු කරනු ලබන අතර, ඒ සඳහා කන්දකාඩු ප්‍රතිකාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.

2. එහෙත් පුනරුත්ථාපනය සඳහා රැඳවියන් මෙම කාර්යාංශය වෙත භාර දීමේදී ඇතැම් අවස්ථාවල යම් ගැටළුකාරී තත්වයන් පැන නැගී ඇති අතර ඇතැම් පුනරුත්ථාපනලාභීන් විසින් මධ්‍යස්ථානය තුල විවිධ කලකොලහල සිදු කිරීම හා පාලන කටයුතු වලට බාධා සිදු කිරීම දිගින් දිගටම සිදු කරනු දක්නට ලැබේ.

3. ඒ අනුව මෙම කාර්යාංශය විසින් පවත්වාගෙන යනු ලබන පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුල දැනට පවතින සීමිත සම්පත් හා ඉඩ පහසුකම් මත පුනරුත්ථාපනලාභීන් මධ්‍යස්ථානය වෙත ඇතුලත් කර ගැනීමේදී යොමුව 'අ' දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයෙහිද සඳහන් කර ඇති පහත සඳහන් අවම නිර්ණායකයන් කෙරෙහි පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය වෙතින් ඉදිරියේදී ඇඩි ලෙස අවධාන යොමු කිරීමට සිදුවන බව මින් කාරුණිකව දන්වා සිටිමි.

අ. රැඳවියන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමේදී වයස අවු 18ට සම්පූර්ණ වූ අයවළුන්ගේ සිට අවු 45 දක්වා වූ වයස් කාණ්ඩයට අයත් වූවන් පමණක් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම. (පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු පිරිවැයක් රජය මඟින් දරණ අතර වයස අවු 45 ඉක්මවූ අයවළුන් පුනරුත්ථාපනය කිරීම ඵලදායි නොවන බව නිරීක්ෂණය වන අතර වයස අවු 45 ඉක්මවූ අයවළුන් පුනරුත්ථාපන ක්‍රියාවලියට අනුගත වීමටද ඉතාමත් මැලිකමක් දක්වන අතරම එය අනෙකුත් පුනරුත්ථාපනලාභීන් හට වැරදි පූර්වාදර්ශයක් බවත් පෙනී ගොස් තිබේ.)

ආ. පුනරුත්ථාපනය කිරීමට සුදුසු බවට වෛද්‍ය නිලධාරීගේ නිර්දේශයක් සහිත වෛද්‍ය වාර්තාවක් ලබාදීම හා මානසික ආබාධ, සමාජ රෝග, බෝවන රෝග, විවිධ ශාරීරික ආබාධ ඇති අය හා දීර්ඝ කාලීනව විවිධ රෝගාබාධයන් සඳහා ප්‍රතිකාර ලබමින් සිටින අය යොමු නොකිරීම.

ඇ. රැඳවියන් පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත ඇතුළත් කිරීමේදී මාස 06ක පුනරුත්ථාපන කාල සීමාවක් සඳහා පමණක් ඇතුළත් කර ගැනීම.

ඈ. පුනරුත්ථාපනය සඳහා රැඳවියන් යොමු කිරීමේදී පුනරුත්ථාපන නඩුවට අමතරව ඔවුන් හට ගොනු කර ඇති අනෙකුත් නඩු අවසන් වූ අයවළුන් පමණක් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යොමු කිරීම. (පුනරුත්ථාපන කාලය අතරතුර විටින් විට අධිකරණයන් වෙත ඉදිරිපත් කිරීමේදී පුනරුත්ථාපන ක්‍රියාවලිය අඩාල වීම.)

ඉ. අන්තරායකර මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පමණක් පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා යොමුකිරීම. (බරපතල ගණයේ විවිධ අපරාධ සිදු කල අයවලුන් යොමු නොකිරීම - මිනීමැරීම්, ස්ත්‍රී දූෂණ, මංකොල්ල කෑම් ආදී වැරදි සිදු කල අය)

ඊ. කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙතින් එක් වරක් පුනරුත්ථාපනය වූවන් නැවත පුනරුත්ථාපනය සඳහා කන්දකාඩු වෙත යොමු නොකිරීම.

උ. මෙම කාර්යාංශය සතුව කන්දකාඩු, සේනපුර හා වව්නියාව යන ප්‍රදේශයන්හි මධ්‍යස්ථාන 03ක් ස්ථාපිත කර ඇත. එම මධ්‍යස්ථාන තුළ පවතින සීමිත ඉඩ පහසුකම් හා සම්පත් මත එකී මධ්‍යස්ථානයන්හි පරිපාලනමය රාජකාරි පහසු කරලීම සඳහා අධිකරණ වෙතින් පුනරුත්ථාපනය වීම සඳහා නියෝග ලබා දීමේදී කන්දකාඩු, සේනපුර හෝ වව්නියාව පුනරුත්ථාපන මධ්‍යස්ථානය වශයෙන් නම් නොකර පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ පුනරුත්ථාපනය වීම සඳහා නියෝග ලබා දීම. එමගින් ඒ ඒ අවස්ථාවන්හිදී අදාල මධ්‍යස්ථානවල ඇති ඉඩ පහසුකම් සලකා බලා පුනරුත්ථාපනය සඳහා සුසුදු මධ්‍යස්ථානයකට යොමු කළ හැකි වේ.

4. පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් සාර්ථකව සහ ඵලදායී ලෙස සිදු කිරීම උදෙසා උක්ත කරුණු සබැඳිව ඔබතුමියගේ අවධානය යොමු කර නීතිපතිතුමා මඟින් අග්‍රවිනිශ්චයකාරතුමා දැනුවත් කර හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් මඟින් මේ පිළිබඳව දිවයිනේ සියළුම මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කිරීමට අවැසි කටයුතු සිදු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩීඩියුකේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ඒ
මේජර් ජෙනරල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

පිටපත් (බාහිර):

1.ලේකම් - අධිකරණ සේවා කොමිෂන් සභාව

2.අතිරේක ලේකම් - එච්. එම්. එන්. සී. ධනසිංහ මහතා, බන්ධනාගාර කළමණාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය